ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/9/2018 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2018.05.01 |
|---|---|---|---|---|---|

## ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 06-2018

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්
හා ගණන් දීමේ නිලධාරීන් වෙත.

**ඉංජිනේරු උපාධිධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවාගෙන රාජ්‍ය අංශයේ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ඉංජිනේරු වෘත්තිකයන් හට වරලත් ඉංජිනේරු දීමනාව ලබාදීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 04/2018 හා 2018.02.21 දිනැති ලිපිය හා බැඳේ. (එම චක්‍රලේඛයේ පිටපතක් මේ සමග අමුණා ඇත.)

**02.** එම චක්‍රලේඛය දකුණු පළාත් සභාවට අදාළ කර ගැනීමට ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/06/3/12 හා 2018.04.25 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

**03.**එහි ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වරලත් ඉංජිනේරුවරුන් සඳහා ඉංජිනේරුවරුන්ගේ සේවා කාලය පදනම් කර ගෙන පහත සඳහන් පරිදි දීමනාවක් 2018.02.01 දින සිට ගෙවීමට, 2018.01.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇති බව සඳහන් කර ඇත.

| සේවා කාලය | මසකට දීමනාව |
|---|---|
| වසර 10 ට අඩු සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු.15,000/- |
| වසර 11 ත් 20 ත් අතර සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු.20,000/- |
| වසර 21 ත් 25 ත් අතර සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු.25,000/- |
| වසර 25 ට වැඩි සක්‍රීය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු.30,000/- |

**04.** මෙම උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දැනුම් දෙන අතර මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව යටතේ පවතින සියලු ආයතන දැනුවත් කරන ලෙසද වැඩිදුරටත් දන්වා සිටිමි.

ආර්. සී. ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01.සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02.නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/ පිරිස් හා පුහුණු), දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.
03.අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.
04. අධ්‍යක්ෂ (අයවැය/ ගිණුම් හා ගෙවීම්), දකුණු පළාත් සභාව : අ.ක.ස.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343
කාර්යාලය / காரியாலயம் / Office 091 2234052 091 2226118
ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල.
Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2018

මගේ අංකය : ES/1/චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2018.02.21

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

**ඉංජිනේරු උපාධිධාරීන් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට බඳවාගෙන රාජ්‍ය අංශයේ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ඉංජිනේරු වෘත්තිකයන් හට වරලත් ඉංජිනේරු දීමනාව ලබා දීම**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ වරලත් ඉංජිනේරුවරුන් සඳහා ඉංජිනේරුවරුන්ගේ සේවා කාලය පදනම් කර ගෙන පහත සඳහන් පරිදි දීමනාවක් 2018.02.01 දින සිට ගෙවීමට, 2018.01.30 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

| සේවා කාලය | මසකට දීමනාව |
|---|---|
| වසර 10 ට අඩු සක්‍රිය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු. 15,000/- |
| වසර 11 ත් 20 ත් අතර සක්‍රිය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු. 20,000/- |
| වසර 21 ත් 25 ත් අතර සක්‍රිය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු. 25,000/- |
| වසර 25 ට වැඩි සක්‍රිය සේවා කාලයක් ඇති නිලධාරීන් | රු. 30,000/- |

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය